සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

උපදෙස්
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

**I** කොටස
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**II** කොටස
- අනු කොටස් තුනකින් යුක්ත වේ.
- එක් අනු කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 05 තෙක් වූ ප්‍රශ්වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** යන රූප සටහන් වලින් තෝරන්න.


A


B


C


D


E

(01) A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ලීයෙන් කරන ලද කැටයමකි.
(2) ඉන්දුනිම්නයෙන් හැමුවූ මැටියෙන් කරන ලද මුද්‍රාවකි.
(3) මිසරයන් භාණ්ඩවලට යෙදූ සත්ව කැටයමකි.
(4) ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවමකි.
(5) යුරෝපයේ ගුහා සිතුවමකි. (........)

(02) B අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
(1) ලාංකික චිත්‍ර ශිල්පී එච්. ඒ. කරුණාරත්නගේ සිතුවමකි.
(2) වළං කර්මාන්තයේ යෙදෙන්නෙකුගේ දුක්ඛිත ජීවන රටාවකි.
(3) ශාස්ත්‍රාලයීය ශිල්ප ක්‍රම උපරිම ඇසුරින් භාවිතයට ගත් උසස් නිර්මාණයකි.
(4) ස්ටැන්ලි අබේසිංහගේ කදිම නිර්මාණයකි.
(5) සම්පිණ්ඩනය මනාව දක්වමින් භාවමය ගුණ මතුකිරීමට ගත් උත්සාහයකි. (........)

(03) C අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ඉන්දියානු චිත්‍ර ශිල්පී නන්දලාල්බෝස්ගේ නිර්මාණයකි.
(2) ජෝර්ජ් කීට් ශිල්පියාගේ 'නායිකා' නම් සිතුවමකි.
(3) සීගිරියේ ඇති කාන්තා සිතුවමකි.
(4) මහියංගන ධාතු ගර්භයෙන් සොයාගන්නා ලද සිතුවමකි.
(5) ගෝතමී විහාරගේ ඇඳ ඇති කාන්තාවකගේ සිතවමකි. (........)

(04) D අක්ෂරයෙන් දැක්වෙන මැඩෝනා චිත්‍රය,

(1) ඇල්බා මැඩෝනා නමින් හැඳින්වේ. (2) සිස්ටයින් මැඩෝනා නමින් හැඳින්වේ.
(3) මැඩෝනා ඔෆ් ද ඩියුක් නමින් හැඳින්වේ. (4) මැඩෝනා ඔෆ් ද මෙඩො නමින් හැඳින්වේ.
(5) මැඩෝනා ඔෆ් ද වෙයා නමින් හැඳින්වේ. (........)

(05) E අක්ෂරයෙන් දැක්වෙනුයේ 'බෝට්ටු සාදයේ දිවා ආහාරය' නමැති සිත්තමයි. මෙය අඳින ලද්දේ,

(1) එඩුවාඩ් මැනේ විසිනි. (2) සැල්වදෝර් ඩාලි විසිනි.
(3) පියරේ ඔගස්තේ රෙනුවා විසිනි. (4) ක්ලෝඩ් මොනේ විසිනි.
(5) සෙසාන් විසිනි. (........)

- **අංක 06 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(06) නූතනයේ විශාල දැන්වීම් මුද්‍රණය කරන ක්‍රමය වන්නේ,

(1) සේද රාමු මුද්‍රණ ක්‍රමයයි. (2) සමතල මුද්‍රණ ක්‍රමයයි.
(3) මොනොක්‍රෝම් මුද්‍රණ ක්‍රමයයි. (4) ඩිජිටල් මුද්‍රණ ක්‍රමයයි.
(5) උත්තල මුද්‍රණ ක්‍රමයයි. (........)

(07) අච්චුවක් ආධාරයෙන් මූර්ති නිර්මාණයට මුල් කෘතිය සාදාගත යුතුවේ. ඒ සඳහා භාවිතා කරන්නේ,

(1) සිමෙන්ති (2) මැටි (3) ඉටි
(4) ප්ලාස්ටර් ඔෆ් පැරිස් (5) ෆයිබර් ග්ලාස් (........)

(08) පෝස්ටර් චිත්‍රයක විශේෂත්වය වන්නේ,

(1) වර්ණ අඩුවෙන් යෙදීම. (2) වේගයෙන් කියවා ගැනීමේ පහසුව
(3) සිත් ඇදගන්නා සුළු බව (4) කෙටි පණිවිඩයකින් විශාල අර්ථයක් මවා පෑම.
(5) ඉහත පිළිතුරු සියල්ලම (........)

(09) මහනුවර යුගයේ සිතුවම් දක්නට ඇති ස්ථාන තුනක් නම්,


(1) මැදවල, දඹුල්ල, කරගම්පිටිය (2) කතළුව, දෙගල්දොරුව, මැදවල
(3) දඹුල්ල, කරගම්පිටිය, මැදවල (4) මැදවල, දඹුල්ල, දෙගල්දොරුව
(5) කතළුව, මුල්කිරිගල, කරගම්පිටිය (........)

(10) මලක හා කොළයක හැඩයක් ඒකකයක් ලෙස ගෙන පිළිවෙලකට පැතිරී යන අයුරෙන් යෙදීමෙන් කරන නිර්මාණය වන්නේ,

(1) තීරු සැරසිල්ලකි. (2) ව්‍යාප්ත සැරසිල්ලකි. (3) අවිධිමත් මෝස්තරයකි.
(4) සමමිතික මෝස්තරයකි. (5) විධිමත් සැරසිල්ලකි. (........)


- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F, G, H, I, J මගින් දක්වන මූර්ති ඇසුරෙන් තෝරන්න.**


F


G


H


I


J

(11) මෙම සිතුවම් අතරින් ජාතක කතා නිරූපිත චිත්‍ර කොටස් වන්නේ,

(1) F, G (2) H, J (3) G, J (4) F, J (5) G, H (........)

(12) යුරෝපයේ පුබුදු යුගයට අයත් සිතුවම් කොටස් වනුයේ,

(1) G, H (2) F, H (3) J, H (4) F, G (5) I, F (........)

(13) මෙම සිතුවම් අතරින් පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලද සිතුවමකි.

(1) F (2) G (3) H (4) I (5) J (........)

(14) මෙම සිතුවම් අතරින් දෙගල්දොරුව විහාරයේ සිතුවමකි.

(1) G (2) H (3) I (4) F (5) J (........)

(15) මෙම සිතුවම් අතරින් 'ඇතැන්ස් ශාස්ත්‍රාලය' සිතුවම වන්නේ,

(1) H (2) F (3) G (4) J (5) I (........)

- **අංක 16 සිට 20 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් P, Q, R, S, T යන කැටයම් ඇසුරින් විමසන්න.**



**P**




**Q**



**R**



**S**



**T**

(16) P අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) එල්ලෝරා කැටයමකි. (2) අමරාවතී කැටයමකි.

(3) නාගර්ජුන කොණ්ඩ කැටයමකි. (4) කෛලාස නාථ දෙවොල් කැටයමකි.

(5) මහීෂ මාධනී කැටයමකි. (........)

(17) Q අක්ෂරයෙන් දැක්වෙන 'කාසිය' නිර්මාණය කළ රජු,

(1) අජාසත් (2) බිම්බිසාර (3) කණිෂ්ක

(4) අශෝක (5) චන්ද්‍රගුප්ත (........)

(18) R අක්ෂරයෙන් දැක්වෙන්නේ බුදුන් වහන්සේගේ අභිනිශ්ක්‍රමණය බුදුවීම, ප්‍රථම ධර්ම දේශනය දැක්වෙන කැටයමයි. මෙය,

(1) ගුප්ත කැටයමකි. (2) භාරුත් කැටයමකි. (3) අමරාවතී කැටයමකි.

(4) ගන්ධාර කැටයමකි. (5) සාංචි කැටයමකි. (........)

(19) S අක්ෂරයෙන් දැක්වෙන යක්ෂ රූප කැටයම,

(1) සාංචි තොරණේ කැටයමකි. (2) භාරුත් ගල්වැටේ කැටයමකි.

(3) නාගර්ජුන කැටයමකි. (4) ගන්ධාර කැටයමකි.

(5) සාරාණාත් කැටයමකි. (........)

(20) T අක්ෂරයෙන් අශෝක රජු කෝණාගාම මුනිඳු සෑය වැඳීම දැක්වෙන කැයටයමකි. මෙය,

(1) සංචි කැටයමකි. (2) අමරාවතී කැටයමකි. (3) භාරුත් කැටයමකි.

(4) අශෝක රාජ කැටයමකි. (5) ගන්ධාර කැටයමකි. (........)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් K, L, N, M, O මගින් දැක්වෙන මූර්ති ඇසුරින් තෝරන්න.**


K


L


M


N


O

(21) K අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,

(1) හුණුගලින් නිමවූවකි. (2) ගලින් නිමවූවකි. (3) ලෝහයෙන් නිමවූවකි.
(4) කිරිගරුඬෙන් නිමවූවකි. (5) මැටියෙන් නිමවූවකි. (........)

(22) L අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය හමුවූයේ,

(1) මෙසපොතේමියාවෙනි. (2) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයෙනි.
(3) මිසරයෙනි. (4) ග්‍රීකයෙනි.
(5) නයිල් නදියෙනි. (........)

The National e-learning Portal for The General Education

(23) N අක්ෂරයෙන් දැක්වෙන්නේ අතීත දෙවගනයි. මෙය ඇත්තේ,

(1) ශාන්ත මරියා දේව මැඳුරෙහි. (2) පාතිනත් දෙව් මැඳුරෙහි.
(3) ග්‍රීකයෙහි. (4) ලැස්කෝ දේවස්ථානයෙහි.
(5) මිසරයෙහි. (........)

(24) M අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිමවා ඇත්තේ,

(1) කිරිගරුඬ වලිනි. (2) හුණුගලෙනි. (3) රතුවැලි ගලෙනි.
(4) ලෝකඩවලිනි. (5) රත්‍රන් වලිනි. (........)

(25) P අක්ෂරයෙන් දැක්වෙන මිසර මූර්තියේ ටුටන්කාමන්ගේ රුව දැක්වේ. මෙම මූර්තියේ මුහුණට යොදා ඇති ආවරණය සකස් කර ඇත්තේ,

(1) ඇත් දලෙනි. (2) රත්‍රුංවලිනි. (3) රිදියෙනි.
(4) මැටියෙනි. (5) ලීයෙනි. (........)

- **අංක 26 සිට 30 තෙක් වූ අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**

(26) මිසර වැසියා ලේඛන කලාව සඳහා භාවිතා කළ ශාක පත්‍ර වන්නේ,

(1) වැටකේ පත්‍ර (2) තල්පත්‍ර (3) මිසර පත් පත්‍ර
(4) පැපිරස් පත්‍ර (5) ප්‍රැන්රියා පත්‍ර (........)

(27) ගන්ධාර කලාවක් වූ දුෂ්කර ක්‍රියාව කරන බෝසතුන් දැක්වෙන ප්‍රතිමාවේ ඇති මුද්‍රාව කුමක්ද?

(1) වරද මුද්‍රාව (2) ධ්‍යාන මුදුව (3) භූමි ස්පර්ශ මුද්‍රාව
(4) අභය මුද්‍රාව (5) ආශිර්වාද මුද්‍රාව (........)

(28) ලංකාවේ පැරණි චිත්‍ර අතර දුනු ඊතල අතැතිව සිටින සරල සංකේතාත්මක සටහන් මෙන්ම ගව, තලගොයි රූප හමුවන්නේ,

(1) ආඬියාගල ලෙනෙනි. (2) දොරවක ලෙනෙනි.
(3) කදුරුපොකුණ ලෙනෙනි. (4) තන්තිරිමලේ ලෙනෙනි.
(5) බටදොඹ ලෙනෙනි. (........)

(29) කුරුළු දඩයම, මීඩම්හි පාත්තයෝ යනු,

(1) ග්‍රීක සිතුවමකි. (2) රෝම සිතුවමකි. (3) මිසර සිතුවමකි.
(4) අනුරපුර සිතුවමකි. (5) ගන්ධාර සිතුවමකි. (........)

(30) ලෞරියා නන්දගර් අශෝක ස්ථම්භයේ මුදුනේ දැක්වෙන්නේ,

(1) සිංහ රුවකි. (2) අශ්ව රුවකි. (3) ගව රුවකි.
(4) ඇත් රුවකි. (5) හංස රුවකි. (........)

- **අංක 31 සිට 35 තෙක් වූ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

(31) ස්ත්‍රී රුවක කැටයමක් සහිත දුර්ලභ ගණයේ කොරවක් ගලක් හමුවන්නේ මින් කුමන ස්ථානයෙන්ද?

(1) අනුරපුර රත්නප්‍රසාදය (2) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය
(3) පොලොන්නරුවේ ලංකාතිලකය (4) අනුරපුර රුවන්වැලිසෑය.
(5) තිවංක පිළිමගෙයි ඉදිරිපිට (........)

(32) ලේඛන කලාව සඳහා මිසර වැසියා භාවිතා කළ පැළෑටි පත්‍ර නම්,

(1) තල්පත් (2) පුස්කොළ (3) වැටකේ පත්‍ර
(4) පැපිරස් පත්‍ර (5) නියද පැළෑටි (........)

(33) ලංකාවේ පැරණි ලෙන් චිත්‍ර අතර සරල සංකේතාත්මක සටහන් ගව, මොනර, තලගොයි ආදී රූප ඇතුලත් රේඛා සටහන් ඇත්තේ,

(1) මංදොඹ ලෙනෙනි. (2) ආඬියාගල ලෙනෙනි. (3) දොරවක ලෙනෙනි.
(4) කුරුන්දක ලෙනෙනි. (5) තන්තිරිමලෙනි. (........)

(34) හර්මිකා නමැති අංගය දක්නට ලැබෙන්නේ,

(1) වටදාගෙයෙනි. (2) ගල්වැටෙනි. (3) චෛත්‍යයෙනි.
(4) විහාරයෙනි. (5) ප්‍රතිමාඝරයෙනි. (........)

(35) 'දුෂ්කර ක්‍රියා කරන බුදුන් වහන්සේ' නමැති ලෝකඩ මූර්තිය නිර්මාණය කරන ලද්දේ,

(1) තිස්ස රණසිංහ (2) සුමන දිසානායක (3) රිචඩ් ගේබ්‍රියල්

The National e-learning Portal for The General Education

(4) එල්. ටී. පී. මංජු ශ්‍රී (5) එම්. සාර්ලිස් (........)

- **අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.**



(36) ඉහත චිත්‍රයෙන් දැක්වෙන්නේ,

(1) සිතුවමකි. (2) මූර්තියකි. (3) කැටයමකි.

(4) කොළාජ් නිමවුමකි. (5) මියුරල් එකකි. (........)

(37) මෙය නිමවා ඇත්තේ,

(1) මැටියෙනි. (2) කිරිගරුඬෙනි. (3) ලී වලිනි.

(4) හුණුගලෙනි. (5) මේ කිසිදු දෙයකින් නොවේ. (........)

(38) මෙම නිර්මාණය කළ ශිල්පියා,

(1) ප්‍රැක්තිටෙලන් (2) ලිසිපස් (3) පීඩියස්

(4) ඇන්ටියෝච් (5) රෆායල් (........)

(39) මෙම නිර්මාණය කළ මාධ්‍ය,

(1) කිරිගරුඬ (2) මැටි (3) දියසායම්

(4) තෙල්සායම් (5) ලෝහ (........)

(40) මෙයින් නිරූපණය වන්නේ,

(1) රජු සහ සේවකයන් (2) සිරකරුවන්

(3) සර්පයින් වෙලාගත් නාවිකයන් (4) පියා හා දරුවන්

(5) පිය පුතුන් වෙලාගත් මුහුදු සර්පයින් (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - I

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

## II කොටස

### "අ" කොටස

01. ශ්‍රී ලංකාවේ බුදු පිළිම අතර, අනුරාධපුර යුගයට අයත් බුදු පිළිම සුවිශේෂී ස්ථානයක් හිමිකර ගන්නේ ඒවායේ ඇති විශිෂ්ටතම කලා ලක්ෂණ නිසාය. අනුරාධපුර මහමෙව්නා උයනේ සමාධි බුද්ධ ප්‍රතිමාව සහ අවුකන බුද්ධ ප්‍රතිමාව ඇසුරෙන් මේ පිළිබඳ විමසුමක් කරන්න.

02. සීගිරි සිතුවම් විශ්වකීර්තියට පත් අද්විතීය සිතුවම් කලාවක් වන අතර ක්‍රි.ව. 12 වන සියවස දක්වා ම එම සිතුවම් සම්ප්‍රදාය භාවිත වූ බවට සාක්ෂි ඇත.
   - (i) සීගිරි සිතුවම්වල ශෛලිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   - (ii) හිඳගලින් හමුවී ඇති ක්‍රි.ව. 7 වන සියවසට පමණ අයත්යැයි සැලකෙන සිතුවම් සීගිරි සිතුවම් තරමට ම විද්වත් බවක් දක්වයි. එම සිතුවම් වල වස්තු විෂය හා කලා ලක්ෂණ පිළිබඳ විමසන්න.

### "ආ" කොටස

03. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පහත සඳහන් කලා කෘති අතුරෙන් හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   - (i) අං සහිත දෙවියා
   - (ii) මැටි බඳුන්
   - (iii) මව් දෙවඟන රුව
   - (iv) මොල්ලිය සහිත ගවරුව
   - (v) රතුවැලිගලෙන් නිම වූ කවන්ධ රුව
   - (vi) දිවියෙකු සමග සටන් කරන මිනිසා

04. "සාංචිය බොදු ජනයාට වැදගත් ස්ථානයක් මෙන්ම ලෝක සංස්කෘතික උරුම අතර සුරැකිය යුතු වස්තුවක් ලෙස යුනෙස්කෝ සංවිධානය නම් කර ඇත.
   - (i) සාංචි ස්තූපය හා සම්බන්ධ ගෘහ නිර්මාණාත්මක අංග පිළිබඳ විස්තරයක් කරන්න.
   - (ii) සාංචි තොරණ කැටයමින් බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා නිරූපණය කිරීමට සාංචි කැටයම් ශිල්පියා ගත් උත්සාහය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

### "ඉ" කොටස

05. ආදි මානවයාගේ කලා ප්‍රකාශන දැක්වෙන සිතුවම් පෙළක් යුරෝපයේ ලැස්කෝ **(LASCAUX)** සහ පොන්ට් ද්‍යු ගෝම් **(Font - Du - Guame)** ගුහා වලින් හමු වී ඇත.
   උක්ත ගුහා තුළින් හමුවී ඇති සිතුවම් පිළිබඳ විමසීමක් කරන්න.

06. "මිසරයේ ඉපැරණි කලා නිර්මාණ අදටත් ලොව අභිරහසකි."
   - (i) පිරමීඩයේ නිර්මාණය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   - (ii) මිසර චිත්‍ර වල සුවිශේෂී ලක්ෂණ උදාහරණ හා සබඳමින් විමසන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - II

**12 ශ්‍රේණිය**

උපදෙස්

- **ඔබේ විභාග අංකය, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.**
- **උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙක ඇලීම ඔබට අවාසි විය හැක.**

---

- **ස්වභාවිකත්වය අධ්‍යයනය හා**
- **නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.**

- **පහත කරුණු අවධානයට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැළැටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.**

01. කඩදාසි තලය, අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

02. ද්‍රව්‍යවල හා පැළැටියේ ගති ලක්ෂණ, මතු පිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න.

03. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

04. වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.

05. ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.

06. ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැලපෙන පරිදි වෙනස් කර ගැනීමට පුළුවන.

07. දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කළ හැකිය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - III

**12 ශ්‍රේණිය**

- **මෙම පත්‍රය කොටස් තුනකින් යුක්තය. කොටස් තුනෙන් එක් කොටසක් තෝරාගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.**

---

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

- **පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගන්න.**

01. ලීකෙළි නර්තනයේ යෙදෙන සිසුන්

02. වන්දනාවේ යෙදෙන බැතිමතුන්

03. වන සතුන් ගහණ වු අභය භූමිය

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

04. දොර රෙද්දකට සුදුසු මෝස්තරයක්

05. පුටු ඇන්දට සරිලන ලී කැටයමක්

## 'ඉ' කොටස - ග්‍රැෆික්

06. ආරාධනා පත්‍රයකට සුදුසු නිර්මාණයක් කරන්න.

07. පොත් පිටකවරයකට සුදුසු නිර්මාණයක් කරන්න.

The National e-learning Portal for The General Education

The National e-learning Portal for The General Education